මුල් පිටුව
ඇතුළු පිටු
පුවත්
දේශපාලන
විශේෂාංග
ආර්ථික
කතුවැකිය
ශාස්ත්‍රිය
සිනමා කලා
ක්‍රීඩා
විදෙස් පුවත්
අපගේ වෙබ් අඩවි
The Island
විදුසර
නවලිය

ආරක්ෂක

# ඇල්ෆා කණ්ඩායම ගැන හෙළිදරව් කිරීම



## ශ්‍රී ලංකා දුරකතන ග්‍රාහක ජාලයෙන් පිටත චන්ද්‍රිකා සන්නිවේදන පද්ධති ගෙනඒමේ ලංකා කම්කරු කොන්ග්‍රසයේ අභිරහස් ක්‍රියාදාමය කුමක්ද?

කොටින් එස්. ඒ. 14 මිසයිල ලබාගැනීම නිසා සියලුම හෙළිකොප්ටර් යානාවලට මිසයිල වෙනත් මගක යවන අධි උෂ්ණාධික උපාංග තිබිය යුතුය.

කොටි සංවිධානය දැන් සාම සාකච්ඡා ගැන හඬක් නගන්නේ නැත. සටන් විරාම ගිවිසුමේ කොන්දේසි මුළුමනින් ම ඉටු කළ යුතු යැයි ද නොකියයි. ඒ වෙනුවට එකවර ද්විත්ව මෙහෙයුමක් ආරම්භ කර තිබේ. ඒ කුමක් සඳහා ද? ප්‍රභාකරන් ප්‍රමුඛ කොටි සංවිධානයේ ගැලවීම උදෙසායි මින් එක් මෙහෙයුමක් නම් තමිල්නාඩු හා කැනඩාවේ කොටින්ට පක්ෂපාතී දේශපාලනඥයන් ලවා ශ්‍රී ලංකාවේ රජය ද්‍රවිඩයන් සංහාරයක යෙදෙන බව ප්‍රකාශ කිරීමයි. දෙවැනි මෙහෙයුම නැගෙනහිර කොටි හමුදා නායකයාව සිටි කරුණා යුද හමුදාව ලවා කෙසේ හෝ නිරායුධ කරලීමයි. මේ සතියේ දිනෙක චෙන්නායි නගරයේ පැවැති ද්‍රවිඩ ග්‍රන්ථයක් දොරට වැඩීමේ උත්සවය අමතා පට්ටලි මක්කල්කච්චි නමැති පක්ෂයේ නායක රාමදාස් නමැත්තා පැවසුවේ ශ්‍රී ලංකාවේ ද්‍රවිඩයන් සංහාරය වන විට තමිල්නාඩු රජය බලා සිටින බවයි.



කොටි කාන්තාවන් කිලිනොච්චියේදී යුද පුහුණුව ලබමින්

මේ ප්‍රකාශයෙන් පැය කීපයකට පසු තමිල්නාඩු නළුවකු වූ සරත්කුමාර් නමැත්තා ප්‍රකාශයක් කරමින් ද්‍රවිඩයන් සංහාරය කරන තුරු බලා සිටීමට බැරි යැයි කියා සිටියේය. මේ වනවිට ඉන්දීය ගුවන් හමුදාව නවදිල්ලියට පිටින් පිහිටි හින්ඩන් හමුදා කඳවුරේ සිට ඉතා පහළින් පියාසර කෙරෙන ගුවන් යානා හඳුනා ගැනීම සඳහා වූ රේඩාර් පද්ධති දෙකක් මෙරටට එවීමට ක්‍රියා කර තිබිණි. ඉන්දීය ආරක්ෂක බලධාරීහු කොටි ගුවන් යානාවල ආගමනය දැනගැනීම සඳහා ඊශ්‍රායල් හා රුසියානු රේඩාර් පද්ධති රාමේශ්වරම් අවට ස්ථ

ානගත කරද්දී මෙරටට සැපයුවේ භාරත් සමාගම නිෂ්පාදනය කළ රේඩාර් පද්ධති වේ.

1987 මැයි මාසේ 26 වැනිදා වඩමාරච්චි මෙහෙයුම දියත් වූ අවස්ථාවේ ඉන්දීය රෝ චරපුරුෂ සේවාවේ උපදෙස් මත ඉන්දීය ගුවන් හමුදාව මෙම හින්ඩන් හමුදා කඳවුරේ සිට තමිල්නාඩුවේ තන්ජවූර් හරහා හෙළිකොප්ටර් එවා කොටුවී සිටි ප්‍රභාකරන් බේරා ගනු ලැබීය.

මෙවැනි තත්ත්වයක් මැද එම්. ඩී. එම්. කේ. පක්ෂයේ නායක වයිකෝට ද ඉන්දීය රජය රේඩාර් පද්ධති සැපයූ බව වාර්තා විය. ඔහු විගස අගමැති මන්මෝහන් සිං වෙත හදිසි සන්දේශයක් යවමින් ශ්‍රී ලංකාවට සැපයූ රේඩාර් ආපසු ගෙන්වා ගන්නැයි ඉල්ලා සිටියේය. එහෙත් ඉන්දීය රජය වයිකෝ කළ ඉල්ලීමට ප්‍රතිචාර නොදැක්වූයේ ඉන්දියාව ශ්‍රී ලංකාවට රේඩාර් නුදුන්නත් ඊශ්‍රායලය පකිස්තානය භාවිතයෙන් රේඩාර් පද්ධති ලබා ගැනීමට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවට හැකි බව දන්නා නිසාය.

තමිල්නාඩුවේ කොටි ආධාරකරුවන් මෙලෙස සෑම ඉල්ලීමක් ම කළේ ශ්‍රී ලංකා හමුදාව වන්නි මෙහෙයුම් ආරම්භ කළහොත් කොටි නායකත්වය කොටුවන බව දන්නා හෙයිනි. එසේම ප්‍රභාකරන්ගේ වන්නි ව්‍යුහය කරුණා දන්නා නිසා ඔහු සියලු තොරතුරු ශ්‍රී ලංකා හමුදාවට හෙළි කරනු ඇතැයි යන්න කොටි හා ඔවුන්ගේ ආ ධාරකරුවෝ බියට පත් වී සිටිති.

මේ නිසා ඇතැම් මුස්ලිම් පාර්ශ්වයන් - කොටි මාධ්‍ය සහ වෙනත් පාර්ශ්වයන් ලවා කරුණා නිරායුධ කර ඔහු ඝාතනය කරවීම කොටින්ගේ සැලැස්ම වී තිබේ. නැගෙනහිර බිඳ වැටීමෙන් පසු වන්නියේ කොටි ආධිපත්‍යය ද ඇදවැටුණොත් ප්‍රභාකරන්ගේ ඊළාම් රාජ්‍යයේ මහා සැලැස්ම ද අහෝසි වේ.

සටන් විරාම ගිවිසුමින් පසු ත්‍රිකුණාමලයේ පොංගුතමිල් නම් වූ රට දෙකඩ කිරීමේ උත්සවයක් පැවැත්වූ කොටි සංවිධානය ත්‍රිකුණාමලය ඊළාම් දේශයේ අගනුවර යැයි කියා සිටියහ. එම උත්සවයෙන් පසු ප්‍රභාකරන් බලාපොරොත්තු වූයේ නැගෙනහිර ප්‍රදේශය ප්‍රාන්ත අටකට වෙන් කර ඒ සෑම ප්‍රාන්තයකටම අගනුවර බැගින් නම් කිරීමයි. කොටි සංවිධානයේ මහා සැලැස්ම අනුව නැගෙනහිර බෙදීමට තීරණය කර තිබුණේ මෙසේයි.

කුච්චවේලි ප්‍රාන්තය - ප්‍රධාන නගරය - තිරියායි- ත්‍රිකුණාමල ප්‍රාන්තය - (ත්‍රිකුණාමල නගරය) මූතූ ර් ප්‍රාන්තය (කිලිවෙඩ්ඩි)-මඩකලපු ප්‍රාන්තය (කරදියනාරු), වෙල්ලාවලි ප්‍රාන්තය (පේරාරු) අක්කරපත්තු ප්‍රාන්තය (පල්ලිමුනෙයි), පොතුවිල් ප්‍රාන්තය (පොතුවිල්), වාකරේ ප්‍රාන්තය - වාකරේ මේ හැර උතුරේ සිට හලාවත දක්වා ද ප්‍රභාකරන්ගේ ඊළාම් සැලැස්මට අයත් විය. පහත දැක්වෙන්නේ එකී සැලැස්මයි.

වාරනි ප්‍රාන්තය (වඩමාරච්චි සිට තෙන්නමරාච්චි දක්වා) - කාරචි ප්‍රාන්තය කිලිනොච්චි සිට පරන්තන් හා වඩුන්නච්චි දක්වා පුනකාරි ප්‍රාන්තය (මන්නාරම් කලපුව අසල ප්‍රදේශය- මුලතිව් ප්‍රාන්තය - මුලතිව් ප්‍රදේශය මාන්කුලම් ප්‍රාන්තය, මුලතිව් කොටසක් - මන්නාරම කිළිනොච්චි ප්‍රධාන නගරය, මාන්කුලම්- මාන්නායි ප්‍රාන්තය - තලෙයි මන්නාරම අවට කලාපය, මඩු ප්‍රාන්තය-මඩු දේවස්ථාන කලාපය, වවුනියා ප්‍රාන්තය - වන්නි ප්‍රාන්තය - අගනුවර ඕමන්තේ පුත්තලම් ප්‍රාන්තය (ප්‍රධාන නගරය පුත්තලම), හලාවත ප්‍රාන්තය ප්‍රධාන නගරය හලාවත.

ප්‍රභාකරන්ගේ මෙම ඊළාම් දේශ මහා සැලැස්මේ නැගෙනහිර කලාපය පසුගිය ජුනි මාසය තුළදී තොප්පිගල අහිමිවීමෙන් බිඳවැටිණි. මෙම තත්ත්වය මැද ඊළාම් සැලැස්ම මුළුමනින්ම අහෝසි වීම ව්‍යර්ථ කර ගැනීමට පිණිස කොටි සංවිධානය විවි ධ ක්‍රමවේදයන් භාවිත කරන බව සනාථ වී ඇත.

මේ සඳහා කැනඩාවේ කොටින්ට පක්ෂපාතී දේශපාලනඥයන් ලවා වන්නිය මුදා ගැනීමේ මෙහෙයුම නතර කිරීමට ප්‍රයත්න දරන බව අනාවරණය වී තිබේ. කැනඩා පාර්ලිමේන්තුවේ ලිබරල් පාක්ෂික මන්ත්‍රීවරයකු වූ මාර්ක් හොලන්ඩ් පසුගිය සතියේ කැනඩා අගමැති ස්ටීවන් හාපර් වෙත හදිසි සන්දේශයක් යවමින් ශ්‍රී ලංකාවේ ඉදිරි හමුදා මෙහෙයුම් නතර කිරීමට සහාය වන්නැයි ඉල්ලා ඇත. මෙයට ප්‍රතිචාර දැක්වූ කැනඩා විදේශ ඇමැති පීටර් මැකේ පැවසුවේ හමුදා බල යොදවා ශ්‍රී ලංකාවේ අර්බුදය නිමා කිරීමට දරන ක්‍රියා මාර්ගයට කැනඩාව විරුද්ධ බවයි.

මෙලෙස මෙරට ආරක්ෂක හා දේශපාලන කරළියට මැදිහත් වී සිටින ජාත්‍යන්තර පාර්ශ්වයන් කොටි අපරාධකාරී සමාගම බේරා ගැනීමට හැකි සෑම උත්සාහයක් ම දරද්දී නෝර්වීජියානු විදේශ අමාත්‍යාංශයට සම්බන්ධ නෝරාඩ් නම් වූ ස්වේච්ඡා සංවිධානය තම කටයුතු හැටන් ප්‍රදේශයට ද ව්‍යාප්ත කර ඇතැයි සනාථ විය. මෙම නෝරාඩ් සංවිධානය සැපයූ අරමුදල්වලින් හැටන් පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකර ඇති අතර එය පසුගිය සතියේදී විවෘත විය.

මෙම විවෘත කිරීමේ අවස්ථාවට ශ්‍රී ලංකාවෙන් බැහැරව යන නෝර්වීජියානු තානාපති හැන්ස් බ්‍රට්ස්කාර් ද සහභාගි විය. මේ අවස්ථාව වන විට ලංකා කම්කරු කොන්ග්‍රසය වීසැට් නමැති චන්ද්‍රිකා සන්නිවේදන යන්ත්‍ර විස්සක් මෙරටට ගෙන්වා තිබිණි.

ශ්‍රී ලංකා ටෙලිකොම් හෝ වෙනත් පෞද්ගලික දුරකතන ජාලයකට සම්බන්ධ නොවී මේ වීසැට් චන්ද්‍රිකා උපකරණ මගින් විද්‍යුත් ලිපි, ඡායාරූප කටහඬ ඇතුළත් ප්‍රකාශ සහ රහස් වචන මගින් රහස්‍ය පණිවුඩ ද ලොව පුරා යැවිය හැකිය.

2002 වසරේ කොටි සංවිධානය නෝර්වීජියානු රජය හරහා මෙවැනි වීසැට් උපකරණයන් ඇතුළු ටොන් පහක සම්ප්‍රේෂණ යන්ත්‍ර මෙරටට ගෙන්වා ගනු ලැබීය.

එදා පැවැති රජය මේ සම්බන්ධව පැවසුවේ ද්‍රවිඩ ජනතාවට සාම සාකච්ඡා ගැන තේරුම් කර දීමට එකී උපකරණ ගෙන ආ බවයි.

එහෙත් ඒ සෑම උපකරණයක් ම භාවිත කළේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවට එරෙහිවය. මේ නිසා ජාතික ආරක්ෂාවට බරපතල තර්ජනයක් එල්ල විය. අද එම අ ධි තාක්ෂණික උපකරණම ලංකා කම්කරු කොන්ග්‍රසය මෙරටට ගෙන්වා තිබේ. මේ උපකරණ ඇතුළත් මධ්‍යස්ථානයක් කොටගල ප්‍රදේශයේ ස්ථානගත කිරීමට සැලසුම් කර ඇතැයි අනාවරණය විය.

ලෝකයේ බෙදුම්වාදී සංවිධාන රැසක් වීසැට් උපකරණ මගින් ත්‍රස්තවාදී ප්‍රචාර විකාශනය කරද්දී ලංකා කම්කරු කොන්ග්‍රසයට එවන් උපකරණ විස්සක් කුමකටද?

කොටගල ප්‍රදේශය පිළිබඳව විමර්ශනය කළහොත් කොළඹ මල්පාරේ පිහිටි ඒකාබද් ධ මෙහෙයුම් මධ්‍යස්ථානය පුපුරුවා හැරීම පිණිස බෝම්බය ඇටවූ ත්‍රස්තවාදියා වූ වර්ටන් සැඟවී සිටියේ ද එකී ප්‍රදේශයේ යැයි කිව හැකිය. එසේම මේ උපකරණ මගින් ශ්‍රී ලංකා රජයේ බුද්ධි අංශවලට හසු නොවී ඕනෑම ස්ථානයක් සමඟ සම්බන්ධකම් පැවැත්විය හැකිය.

වරක් ලංකා කම්කරු කොන්ග්‍රසයේ ප්‍රධානියකු මෙලෙස පවසා තිබිණි. ප්‍රභාකරන් උතුරු නැගෙනහිර පමණක් නොව උඩරට කඳුකරයේ ද නායකයායි.

මේ නිසා රජයත් ආරක්ෂක අමාත්‍යාංශයත් මේ වීසැට් උපකරණ ගෙන්වීමේ පසුබිම විමර්ශනයට ලක් කළ යුතුය. 2002 සටන් විරාම ගිවිසුමින් පසු කොටින් කිලිනොච්චියේ වන්නි ටෙක් නමින් මධ්‍යස්ථානයක් ස්ථානගත කළහ. මේ වන්නි ටෙක් මධ්‍යස්ථානය කොටින්ගේ අන්තර්ජාල වෙබ් අඩවි පවත්වාගෙන යෑමට සහාය වේ.

මෙවැනි තත්ත්වයක් මත ලංකා කම්කරු කොන්ග්‍රසය වීසැට් පද්ධති විස්සක් මෙරටට ගෙන ආවේ අබිරහස් ක්‍රියාදාමයකට විය නොහැකිද? මේ අතර වන්නියේ ජනතාව බිය ගන්වමින් කොටින් මහා පරිමාණයෙන් දරුවන් බඳවා ගන්නා බව ආරක්ෂක අංශවලට තහවුරු විය. පසුගිය 8 වැනිදා අලුයම ත්‍රිකුණාමලය සහ මුලතිව් අතර මුහුදේදී සොයාගත් ඩිංගි බෝට්ටුවේ සිටි පස්දෙනකුගෙන් යුත් ද්‍රවිඩ ජාතික පවුලෙන් මෙකී තොරතුරු සනාථ විය.

ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව කොයි මොහොතේ හෝ වන්නියට එනු ඇතැයි අපේක්ෂාවෙන් සෑම පවුලකම සිටින සියලු දරුවන් කොටින් පැහැරගෙන යන බව ඔවුහු හෙළි කළහ.

මෙලෙස ප්‍රභාකරන් ප්‍රමුඛ කොටි සංවිධානය යුද්ධයට සූදානම් වෙද්දී කොළඹ සිට ක්‍රියාත්මක වන කොටින්ට හිතවත් ද්‍රවිඩ පුවත්පතක් ප්‍රකාශයක් කරමින් රජයේ හමුදා

ක්‍රියාමාර්ගයට ජාත්‍යන්තර ප්‍රජාව එරෙහි වී ඇති බව කියා සිටියේය. එසේම ශ්‍රී ලංකා රජයේ කටයුතු ගැන සෙවීමට ජාත්‍යන්තර ප්‍රජාවගේ නියෝජිතයන් තිදෙනකු ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතව ඇතැයි ද එකී කොටි හිතවාදී පුවත්පත පළ කර ඇත. මේ නිලධාරීන් නම් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් ලුවිසේ ආචර්, වධහිංසා පැමිණවීම ගැන සෙවීමේ නියෝජිත මැන්ප්‍රෙඩ් නොවාක් සහ අවතැන් වුවන් පිළිබඳව සෙවීමේ එක්සත් ජාතීන්ගේ නියෝජිත වෝල්ටර් කාලින් ය.

මේ නිසා ජාත්‍යන්තර කොටි ජාලයේ ක්‍රමවේදය පැහැදිලි වී තිබේ. මේ එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් මෙරටට කැඳවන්නේ කොටින්ට එරෙහිව වන්නි හමුදා මෙහෙයුම නතර කිරීමේ පරමාර්ථයෙනි.

ලබන දෙසැම්බර් දක්වා කාලය තුළ ඉහත කී විදේශීය නියෝජිතයන් මෙරටට පැමිණෙන බව කොටි හිතවාදීහු පවසද්දී කොළඹ මානව හිමිකම් වෙළෙඳාමට සම්බන්ධ තවත් ස්වේච්ඡා සංවිධානයක් මගින් වධහිංසා නිරීක්ෂණය නමින් ප්‍රකාශනයක් එළිදැක්විණි.

මෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකා හමුදාව හා පොලිසිය ද්‍රවිඩයන්ට අප්‍රමාණ වධහිංසා පමුණුවන බවට ලොව පුරා විකාශනය කිරීමයි. මේ නිසා මානව හිමිකම් වෙළෙඳාම ඉතාමත් ලාභදායී ව්‍යාපාරයක් බවට පත්වී ඇතැයි පැහැදිලි වේ.

මේ අතර පසුගිය 6 වැනිදා කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටි එක්සත් ජාතීන්ගේ කාර්යාලය මළවුන් අනුස්මරණය කිරීමේ ස්ථානයක් බවට පත්විය. කොටි ත්‍රස්තවාදීහු මියගිය ත්‍රස්තයන් සමරණ ආකාරයට ම එක්සත් ජාතීන්ගේ කාර්යාලය තුළ ද මියගිය ස්වේච්ඡා සේවකයන්ගේ ඡායාරූප තබා ඊට මල්දම් පළඳා තිබිණි. මෙහිදී රැස්ව සිටි පිරිස ඇමතු එක්සත් ජාතීන්ගේ සහන සම්බන්ධීකාරක ජෝන් හෝල්ටස් ප්‍රකාශයක් කරමින් මුතූර්හිදී මියගිය සහන සේවකයන් දාහත්දෙනා සම්බන්ධව පරීක්ෂණ කඩිනම් කරන්නැයි රජයෙන් ඉල්ලා සිටියේය.

එහෙත් මේ එක්සත් ජාතීන්ගේ සහන සේවා නිලධාරියා ඇෆ්ගනිස්තානයේදී නේටෝ ගුවන් ප්‍රහාරවලට ගොදුරු වූ සාමාන්‍ය වැසියන් ගැන විමර්ශනය කරන ලෙස ඇමරිකානු රජයෙන් ඉල්ලා නැත.

කොටි සංවිධානය ශ්‍රී ලංකාවේ දේශපාලන සහ ආරක්ෂක නායකත්වය වනසා දැමීම සඳහා අවස්ථාව එනතුරු බලා සිටිද්දී ස්වේච්ඡා සංවිධාන හා එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් දැඩි නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරති.

මේ නිසා රජය ජෝන් හෝල්ටිස් වැන්නන්ගේ හඬට සවන් දිය යුතු ද? මේ අන්දමේ තොරතුරු මෙම සතියේදී අනාවරණය වෙද්දී තොප්පිගල මෙහෙයුමට සම්බන්

ධ විශේෂ බලකායේ ඇල්පා කණ්ඩායම හා එහි අණදෙන නිලධාරීන්ගේ වගතුග හෙළි කිරීමට රජයේ විද්‍යුත් මාධ්‍ය විසින් ක්‍රියා කරන ලදී. මෙයට පෙර සතියේ ද අපි මේ බව කියා සිටියෙමු.

දිගු දුර මෙහෙයුම් ක්‍රියාවලියන් සඳහා යොදා ගන්නේ ඇල්පා බළකායයි. "ජනතාවට තොරතුරු එළිදක්වන්න එහෙත් සතුරන්ට තොරතුරු එළිනොදක්වන්න" යැයි බ්‍රිතාන්‍යයේ හිටපු යුද සෙනෙවියකු වූ වින්සන්ට් චර්චිල් කීපවතාවක් ම පවසා තිබිණි. එහෙත් ලෝකයේ විශේෂ හමුදා කණ්ඩායම් සතුරන්ට එළිනොදැක්විය යුතුය යන පිළිවෙත නොදත් අඥානයන් විද්‍යුත් රූප මගින් ඇල්පා කණ්ඩායම මුළුමනින්ම හෙළි කළහ.

මින් සිදු වූ හානිය සුළුපටු නොවේ. ඇල්පා කණ්ඩායම කවුරුන් ද හා එහි භටයන්ගේ ඡායාරූප ද පොට්ටු අම්මාන්ගේ පරිගණක පද්ධතියට ඇතුළත් විය.

ප්‍රධාන සතුරා කොටි සංවිධානය වී ඇති විටෙක යුද හමුදාවේ විශේෂ ඒකකවල වීඩියෝපට රජයේ ම විද්‍යුත් මාධ්‍ය ලවා විකාශනය වීමට ඉඩ සලස්වන වෙනත් රටවල් ලොව නැත. ප්‍රභාකරන්ගේ බුද්ධි අංශයට තම ත්‍රස්ත කටයුතු ගෙන යෑමට පහසු වී ඇත්තේ මේ නිසා ය. මේ තත්ත්වය මත ඇල්පා කණ්ඩායම පමණක් නොව ඔවුන්ගේ පවුල්වල අයගේ ජීවිත ද අනතුරුදායක තත්ත්වයට පත්කර ඇත. ඊශ්‍රායලයේ විද්‍යුත් මාධ්‍ය මෙලෙස කළා නම් ද්‍රෝහිත්වය  මත ඔවුන්ට එරෙහිව ක්‍රියාකරනු නියතය.

ප්‍රභාකරන් කොටු කළ වඩමාරච්චි මෙහෙයුම දියත් කළ ලුතිනන් ජනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ඇතුළු හමුදා නිලධාරීහු දසදෙනෙක් අරාලිතුඩුවේදී බෝම්බයකට ගොදුරු වීමේ සිද්ධියේ 15 වැනි සැමරුම ද පසුගිය අගෝස්තු 8 වැනිදාට යෙදී තිබිණි. 1992 වසරේ සිදුවූ මෙම අනපේක්ෂිත සිද්ධියෙන් බරපතල තුවාල ලත් කොබ්බෑකඩුව මහතාට ප්‍රතිකාර ලබාදීම ද බරපතල අයුරින් ප්‍රමාද කර තිබුණි. කොබ්බෑකඩුව මහතා රැගත් හෙළිකොප්ටරය ජයවර්ධනපුර රෝහල වෙත පැමිණෙනු ඇතැයි වාර්තා වීම නිසා එහි ශල්‍ය වෛද්‍යවරු සහ හෙදියන් රෝහල් අංගනයට පැමිණ සූදානම්ව සිටියදී ඔවුන්ට දැන ගැනීමට ලැබුණේ විශ්මයජනක දර්ශනයකි. එ් අසාධ්‍ය තත්ත්වයේ සිටි කොබ්බෑකඩුව මහතා රැගත් හෙළිකොප්ටරය රෝහල අහසේ කීපවතාවක් ම කැරකෙන අයුරුයි. අනතුරුව එම හෙළිකොප්ටරය රත්මලාන ගුවන් තොටුපළට පැමිණ තිබේ. එහිදී කොබ්බෑකඩුව මහතා සිටි ට්‍රොලිය විනාඩි 10 ක් ගිනිඅව්වේ තබා තිබූ බව සාක්ෂිවලින් අනාවරණය විය.

අරාලිතුඩුවේ බෝම්බ පිපිරීමේ සිද්ධිය ගැන විවිධ මත පළවෙද්දී වසර කීපයකට පසු බ්‍රිතාන්‍යයේ වයිට් නමැති පුපුරණ ද්‍රව්‍ය විශේෂඥයා විසින් බෝම්බය තිබුණේ පොළව යට ද එසේත් නැත්නම් වාහනයේ සවි කිරීමෙන් ද යන්න ගැන අනාවරණය කරන

ලදී.

වයිට්ගේ නිගමනය වුයේ කොබ්බෑකඩුව ඇතුළු හමුදා නිලධාරීහු පිරිස ඝාතනය වූ බෝම්බය තිබුණේ හමුදා රියේ බවත් එය දුරස්ථ පාලකයක් මගින් පුපුරුවා හැර ඇති බවත් ය.

එසේ ම එම හමුදා ලෑන්ඩ්රෝවර් ජීප් රිය පවා පනාගොඩ හමුදා කඳවුරේ පොත්පත්වල සටහන් වී නොතිබූ බව ද සාක්ෂිවලින් අනාවරණය විය.

කොටි සංවිධානය ඩෙන්සිල් කොබ්බෑකඩුව ඇතුළු පිරිස ඝාතනය කිරීමට බෝම්බය වළ දැමුවේ නම් තුවාල ලත් කොබ්බෑකඩුව රැගත් හෙළිකොප්ටර් යානාව ජයවර්ධනපුර රෝහල අහසේ කැරකුණේ කුමක් නිසාද?

අපරාධ වසන් කිරීමට උත්සාහ කළත් යම්දිනෙක අපරාධකරු අනාවරණය වනු ඇතැයි ඇලෙක්සැන්ඩර් ඩූමා නමැති මහා ගත්කරුවා වරක් පැවසීය.

කොබ්බෑකඩුව, විජය විමලරත්න ඇතුළු හමුදා නිලධාරීන්ගේ ඝාතනවලට වසර 15 ක් සපිරෙන අවස්ථාවේදී කිව හැක්කේ එයයි. මේ ඝාතන පිළිබඳ අතීතය ආවර්ජනය කරන විට බොහෝදෙනා පවසන්නේ ඝාතනය වීම ගැන පමණකි. ඝාතකයා කවුරුන්දැයි පැවසීමට ඔව්හු බියක් දක්වති.

දූෂිඩ කියමනක සඳහන් වන්නේ දූන්න ගැන මිස දූනුවායා ගැන පවසන්නේ නැති බවයි. අරාලිතුඩුවේදී ඇති වූ සිද්ධියේදී සිදු වී ඇත්තේ එයයි. මේ අතර කොටින් සැහැල්ලු ගුවන් යානා පැදවීම හා කොටි කණ්ඩායමක් ගුවන් යානා ඉංජිනේරු ශිල්පය හැදෑරුවේ කෙසේද යන්න බුද්ධි අංශ මගින් පසුගිය කාලය තුළ විමර්ශනයක් කරනු ලැබීය.

එහෙත් යුක්රේනයේ ගුවන් යානා ඉංජිනේරු ශිල්පය හැදෑරීම සඳහා සිසුන් බඳවා ගන්නා බවට එක්තරා ආයතනයක් විසින් සඳහන් කර තිබේ.

කොටි සංවිධානය ගුවන් ඒකකයක් පිහිටුවා තිබියදී ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරයකින් තොරව යුක්රේනයේ පුහුණුවීම්වලට මෙරට පිරිස් යැවිය හැකිද? ගුවන් හමුදාවේ බුද්ධි අංශය මේ ගැන විමර්ශනය නොකරන්නේ මන්ද? තමිල්නාඩුවේ ප්‍රධාන පෙළේ කොටි ආධාරකරුවකු වූ නෙඩුරාමන් සැප්තැම්බර් 12 වැනිදා රාමේශ්වරම් සිට කොටින්ට ඖෂධ හා ආහාර තොග ගෙන ඒමට සූදානම් වන බවට වාර්තා වුයේ ද මේ සතියේයි. එහෙත් නෙඩුරාමන්ට ශ්‍රී ලංකා මුහුදු කලාපයට ඇතුළුවීමට ඉඩ නොදෙන බව ඉන්දීය වෙරළාරක්ෂක සේවාව පවසා තිබේ. ප්‍රභාකරන්ගේ සමීපතම සගයකු වූ නෙඩුරාමන් ශ්‍රී ලංකාවේ මුහුදු සීමාව හරහා ඇතුළු වුවහොත් ඔහු අත්අඩංගුවට ගන්නැයි ආරක්ෂක බලධාරීහු ශ්‍රී ලංකා නාවික හමුදාවට

නියෝග කර ඇත.

කොටි සංවිධානය පසුගිය ජුනි මාසයේදී නෙඩුරාමන්ව ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරට ගෙන ගොස් ඔහු ලවා ශ්‍රී ලංකා රජය ද්‍රවිඩයන් සංහාරයේ යෙදෙන බවට ප්‍රකාශ කළත් එම උත්සාහය සාර්ථක වුයේ නැත.

මේ අතර ශ්‍රී ලංකාවෙන් බැහැරව යන නෝර්වේ තානාපති හැන්ස් බ්‍රටිස්කාර් අවසන් වරට ද ස්වෙච්ඡා සංවිධාන ජාලයට සම්බන්ධ පිරිස් හා නෝරාඩ් සංවිධානයේ අරමුදල් ලබාගත් විවිධ පාර්ශවයන් කැඳවා සාදයක් පවත්වනු ලැබීය. හැන්ස් බ්‍රටිස්කාර් වෙනුවට පත් කර ඇත්තේ ටොරේ හාට්රෙම් නමැති ජ්‍යෙෂ්ඨ තානාපති නිලධාරියෙකි.

කොටින් අවි දරද්දී කරුණාගේ පාර්ශවය නිරායුධ කිරීම සඳහා විවිධ පාර්ශවයන් ගත් උත්සාහයන් ද සාර්ථක වුයේ නැත. අපේ ආරක්ෂාව තහවුරු වූ විට අපි සන්නද් ධ අංශය විසුරුවා හරින්නෙමු යැයි කරුණාගේ පක්ෂය කියා සිටියේය. මෙම සතියේ ආරක්ෂක කරළිය තුළ මෙවැනි තොරතුරු අනාවරණය වෙද්දී කොළඹ කොටි ප්‍රචාරක ඒකකය විසින් තවත් මෙහෙයුමක් දියත් කර ඇත. ඒ පොලිස් නිල ඇඳුමින් සැරසී සන්නද්ධ පිරිස් ද්‍රවිඩ තරුණයන්ට කොළඹින් පිටව යන ලෙස තර්ජනය කරන බවට ප්‍රචාරය කිරීමයි.

මෙයට සමගාමීව කොටින්ට පක්ෂපාතී ස්වෙච්ඡා සංවිධාන අලුතින් අන්තර්ජාල වෙබ් අඩවි ආරම්භ කරමින් ත්‍රිකුණාමලයේ අවතැන්වුවන් අතිශය දුෂ්කර ජීවිතයක් ගත කරන බවට ප්‍රචාරයක් විකාශනය කර ඇත. මේ අන්තර්ජාල වෙබ් අඩවිය ආරම්භ කළ තැනැත්තා කවුරුන්දැයි දැන් හෙළි වී තිබේ.

ශ්‍රී ලංකාවේ පුරවැසි මාධ්‍යවේදියා නමින් හඳුන්වා ගනිමින් ආරම්භ කර ඇති මේ කොටින්ට පක්ෂපාතී වෙබ් අඩවියෙන් පවසා ඇත්තේ හමුදාපති ඝාතන ප්‍රයත්නයෙන් පසු යුද හමුදාව ත්‍රිකුණාමලයේ එච්ලන්පත්තු ගම්මානයට මෝටාර් සහ රොකට් ප්‍රහාර එල්ල කළ බවයි. මින් පැහැදිලි වන්නේ වන්නි කොටි බේරා ගැනීමට මෙරට ස්වෙච්ඡා සංවිධාන විශාල මෙහෙයුමක් අරඹා ඇති බවයි.

මේ අතර එක්සත් ජාතීන්ගේ මානුෂික කටයුතු පිළිබඳ නියෝජිත ජෝන් හෝල්ම්ස් ප්‍රකාශයක් කරමින් ඉතා ඉක්මනින්ම කරුණාගේ පාර්ශවය නිරායුධ කළ යුතු යැයි ශ්‍රී ලංකා රජය වෙත කියා සිටියේය.

ජෝන් හෝල්ම්ස් මේ ප්‍රකාශය කළේ කොටින් අවි දරද්දීය. රජය ජෝන් හොල්ම්ස්ගේ ඉල්ලීම ඉටු කළ යුතුද? එක්සත් ජාතීන්ගේ සංවිධානය කොටින්ට නිරායුධ වන්නැයි නොකියන්නේ මන්ද?

මානුෂික කටයුතු ගැන සොයා බැලීමට පැමිණි එක්සත් ජාතීන්ගේ නියෝජිතයා කරුණාව නිරායුධ කළ යුතු යැයි කළ ඉල්ලීම නිසා කොටි සංවිධානය අතිශයින්ම සතුටට පත් විය. ඔවුන් එදා සිටම මෙම ඉල්ලීම කර තිබුණි. එහෙත් වන්නි කොටි හා කරුණා පාර්ශ්වය අතර ඇති අර්බුදයට රජය මැදිහත්විය යුතුද? මෙම ඉල්ලීමට පසුගිය සිකුරාදා කොටින්ගේ සියලුම අන්තර්ජාල වෙබ් අඩවිවල මුල්තැන දී තිබිණි.

**කීර්ති වර්ණකුලසූරිය**

චීන නිෂ්පාදිත බංකර් විනාශ කළ හැකි බංකර් ඔස්ටර් උපකරණ

Powered By - weblink e-commerce & content services

UPALI
සීමාසහිත උපාලි පුවත්පත් සමාගම
අංක 223 , බිලූමැන්ඩල් පාර, කොළඹ 13, ශ්‍රී ලංකාව